# 7. ජනගහනය, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

## 7.1 සමස්ත නිරීක්ෂණ

2000 වසරේදී, මධ්‍ය වාර්ෂික ජනගහන වර්ධන අනුපාතිකය තවදුරටත් වැඩිවූ අතර, මෙය 1998 සිට පැවති ප්‍රවණතාවයට අනුකූල විය. ස්වාභාවික ජනගහන වැඩිවීම (උපත් සංඛ්‍යාවෙන් මරණ සංඛ්‍යාව අඩු කළ විට) සහ ශුද්ධ සංක්‍රමණයක් වැඩිවීම (ආගමන සංඛ්‍යාවෙන් විගමන සංඛ්‍යාව අඩු කළවිට ) යන සාධක 2000 වසරේදී මධ්‍ය වාර්ෂික ජනගහන වර්ධන අනුපාතිකය ඉහළයාමට හේතු විය. ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය සියයට 49 ක් වශයෙන් පිළිබිඹු කරමින් 2000 වසරේ තෙවැනි කාර්තුව අගදී කුටුම්බ ශ්‍රම බලකාය දශ ලක්ෂ 6.7 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2000 වර්ෂයේ මුල් කාර්තු තුන තුළදී අළුත් රැකියා 260,000 ක් පමණ උත්පාදනය වූ අතර මෙමගින් සමස්ත සේවා නියුක්තිය 1999 දී පැවති ශ්‍රම බලකායෙන් සියයට 91 සිට 2000 වසරේදී සියයට 92 දක්වා ඉහළ ගියේය. පෞද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයෙහිම රැකියා අවස්ථාවල වර්ධනයක් දකින්ට ලැබිණි. 1999 සහ 2000 වර්ෂ වලදී විරැකියාව සියයට 9 සිට සියයට 8 දක්වා පහත වැටුණි. කෙසේවුවද 2000 වසරේදී සමස්ත සේවා නියුක්තියෙහි රාජ්‍ය අංශයේ සේවානියුක්ති දායකත්වය තවදුරටත් පහත වැටුණු අතර පෞද්ගලික අංශය ප්‍රධාන සේවා නියුක්ති උත්පාදක අංශය ලෙස තව දුරටත් පැවතිණි. විදේශ සේවා නියුක්තිය 166,000 ක් පමණ විය. ශ්‍රම වෙළෙඳපොළ තුළ පවතින අවශ්‍යතාවයන් හා අධ්‍යාපන සුදුසුකම් නොගැලපීම උගත් තරුණ කොටස් අතර විරැකියාව තවදුරටත් ඉහළ මට්ටමක පැවතීමට හේතුවූ අතර මෙමගින් අධ්‍යාපනික ප්‍රතිසංස්කරණවල ඇති අවශ්‍යතාවය බෙහෙවින් පැහැදිලි විය.




7.1 රූප සටහන
ශ්‍රම බලකායෙහි ප්‍රවණතාවයන් සහ විරැකියාව
(1990-2000)

## 7.2 ජනගහනය

2000 වසරේ දී මධ්‍ය වාර්ෂික ජනගහනය දශ ලක්ෂ 19.36 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මධ්‍ය වාර්ෂික ජනගහන වර්ධනය 1.7 ක් වූ අතර සංසන්දනාත්මකව 1999 දී මෙය 1.4 ක් විය. ජනගහනයෙහි ස්වභාවික වර්ධනය හා ශුද්ධ සංක්‍රමණයන්හි ඉහළ යාම මධ්‍ය වාර්ෂික ජනගහන වර්ධනයෙහිලා දායක විය. ජනගහනයෙහි ස්වභාවික වර්ධනය 1999 දී පුද්ගලයන් 209,000 වූ අතර 2000 දී පුද්ගලයන් 230,000 දක්වා ඉහළ ගියේය. මේ අතර ශුද්ධ සංක්‍රමණයන් පසුගිය වසරේදී වූ පුද්ගලයන් 60,000 හා සසඳන විට 2000 දී පුද්ගලයන් 87,000 ක් විය. මේ අනුව, ස්වභාවික ජනගහන සහ ශුද්ධ සංක්‍රමණයන්හි වැඩිවීම හේතුකොටගෙන මධ්‍ය වාර්ෂික ජනගහනයට ඇතුලත් වූ මුළු එකතුව පුද්ගලයන් 317,000 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. භූමි වර්ග කිලෝමීටරයක් තුළ ජීවත්වන ජන සංඛ්‍යාව කෙතෙක්දැයි පෙන්වන ජනගහන ව්‍යාප්තිය, 1999 දී වූ 304 සිට 2000 දී 309 දක්වා ඉහළ ගියේය.

7.1 සංඛ්‍යා සටහන
**ජනගහනය පිළිබඳ මූලික දත්ත**

| වර්ෂය | මධ්‍ය වාර්ෂික ජනගහනය(අ) ('000) | මධ්‍ය වාර්ෂික ජනගහන වර්ධනය % (ආ) | දළ උපත් අනුපාතිකය(ආ) (පුද්ගලයින් දහසකට) | දළ මරණ අනුපාතිකය(ආ) (පුද්ගලයින් දහසකට) | ශුද්ධ සංක්‍රමණ (ආ) (පුද්ගලයන් දහසකට) |
|---|---|---|---|---|---|
| 1990 | 17,015 | 1.1 | 21.1 | 6.1 | -3.7 |
| 1991 | 17,267 | 1.5 | 19.7 | 5.6 | 0.8 |
| 1992 | 17,426 | 0.9 | 20.8 | 5.7 | -5.9 |
| 1993 | 17,646 | 1.3 | 20.4 | 5.6 | -2.2 |
| 1994 | 17,891 | 1.4 | 20.2 | 5.5 | -0.8 |
| 1995 | 18,136 | 1.4 | 19.4 | 5.6 | -0.1 |
| 1996 | 18,336 | 1.1 | 18.7 | 6.4 | -1.4 |
| 1997 | 18,552 | 1.2 | 18.5 | 6.2 | -0.5 |
| 1998 | 18,774 | 1.2 | 17.8 | 6.2 | 0.4 |
| 1999 | 19,043 | 1.4 | 17.0 | 5.9 | 3.2 |
| 2000(ඇ) | 19,359 | 1.7 | 17.9 | 6.0 | 4.6 |

මූලයන් : රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ජන සංගණන පවතින වසරවලදී ජනගහන පිළිබඳ දත්ත එම සංගණනයේ තොරතුරු මගින් ලබාගන්නා අතර, සංගණනය සිදු නොකරන වසර සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් මධ්‍ය වාර්ෂික ජනගහන දත්ත ඇස්තමේන්තු කරනු ලබන්නේ ජන සංගණන දත්ත, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් සපයනු ලබන මූලික දත්තයන් වන උපත් හා මරණ සහ සංක්‍රමණික දත්තයන් අනුසාරයෙනි. ජන සංගණනයන් සාමාන්‍යයෙන් වසර 10 කට වරක් පැවැත්වෙන නමුදු අවසන් වරට ජන සංගණනය පැවැත්වූයේ 1981 දීය. මීලඟ සංගණනය 2001 වසර තුළදී නිම කිරීමට බලාපොරොත්තු වේ.

(ආ) රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද මධ්‍ය වාර්ෂික ජනගහන ඇස්තමේන්තු අනුසාරයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගණනය කරන ලදී. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් වාර්ෂික දත්ත භාවිතයෙන් ගණනය කරන ලද මෙම වර්ධන වේග සංඛ්‍යා ලේඛන පරිශිෂ්ටයෙහි සංඛ්‍යා සටහන අංක 44 හි සඳහන් කොට ඇත.

(ඇ) තාවකාලික

2000 ලෝක සංවර්ධන වාර්තාව (World Development Report 2000) ට අනුව දකුණු ආසියාතු කලාපයේ රටවල් බොහොමයකට වඩා ශ්‍රී ලංකාවෙහි වාර්ෂික ජනගහන වර්ධන අනුපාතය අඩු මට්ටමක පැවතිණි. මෙයට හේතුවූයේ මෑත වර්ෂවලදී ජනගහන ව්‍යුහයෙහි ඇති වූ වෙනස්වීම් සමග බැඳුනාවූ අනෙකුත් සමාජ ආර්ථික තත්ත්වයන් වර්ධනයවීම ය.

**7.2 සංඛ්‍යා සටහන**
**දකුණු ආසියා කලාපයේ ජනගහන දත්ත**

| රට | ජනගහනය (දශලක්ෂ) | | වාර්ෂික ජනගහන වර්ධනය (සාමාන්‍යය)(%) | | ජන ඝනත්වය (ව.කි.මී.1 කට පුද්ගලයන්) |
|---|---|---|---|---|---|
| | 1998 | 2015(අ) | 1980-98 | 1998-2015(අ) | 1999 |
| ඉන්දියාව | 979.7 | 1,224.4 | 2.0 | 1.3 | 336 |
| පකිස්ථානය | 131.6 | 194.6 | 2.6 | 2.3 | 175 |
| බංග්ලාදේශය | 125.6 | 161.8 | 2.1 | 1.5 | 981 |
| නේපාලය | 22.9 | 32.5 | 2.5 | 2.1 | 164 |
| **ශ්‍රී ලංකාව** | **18.8** | **22.6** | **1.3** | **1.1** | **304** |

(අ) ප්‍රක්ෂේපණ

මූලය : ලෝක සංවර්ධන වාර්තාව 2000/2001

කෙසේ වුවද, ජනගහනයට වාර්ෂිකව පුද්ගලයන් 200,000 සිට 300,000 පමණ එකතුවීම තුළින් රටෙහි ඇති සීමාසහිත සම්පත් මත දරිය නොහැකි බරක් පැටවේ. මෙයට අමතරව, අවුරුදු 14 සහ ඉන් පහළ වයස් කාණ්ඩයෙහි වර්ධනයට වඩා වැඩි වේගයකින් අවුරුදු 55 සහ ඉන් ඉහළ වයස් කාණ්ඩයෙහි වර්ධනයවීම තවදුරටත් සිදු වූ අතර වැඩි වයස් කාණ්ඩයෙහි කොටස අඛණ්ඩව වර්ධනයවීම ජනගහනය වයස්ගතවීම හා සම්බන්ධ ගැටළු නිර්මාණය වීමට හේතු වේ. විරැකියාව, යැපෙන්නන්ගේ අනුපාතිකය ඉහළයාම, කුඩා කොටස්වලට ඉඩම් කැබලිවීම, අධ්‍යාපනය, සෞඛ්‍ය නිවාස වැනි සමාජ සුභසාධන කටයුතු සඳහා ඉහළ වැයක් දැරීමට සිදුවීම වැනි ගැටළු හා වයස්ගත ජනගහනය සහ බැඳුණු ගැටළු, වර්තමාන ජනගහන ව්‍යුහය හා ප්‍රවණතාවයන් සමග ඇඳුණු සමාජ හා ආර්ථික ප්‍රශ්න වන අතර ඒවා සඳහා කඩිනමින් විසඳුම් සෙවිය යුතු වේ. විශේෂයෙන් වැඩකරන ජනතාව මතට අමතර බරක් නොපැටවෙන පරිදි වයස්ගත වූවන්ගේ ජීවන තත්ත්වයන් හොඳින් පවත්වා ගෙන යෑම සඳහා නිසි ලෙස සැලසුම් කරන ලද සමාජ ආරක්ෂණ ක්‍රමයක් සැකසිය යුතු වේ.

## 7.3 ශ්‍රම බලකාය

අදළ කාලච්ඡේදය තුළ වයස අවුරුදු 10 සහ ඊට වැඩි, රැකියාවක් කළහැකි හෝ රැකියාවක් කිරීමට බලාපොරොත්තු වන පුද්ගලයන් සංඛ්‍යාව එම කාලච්ඡේදයේ ශ්‍රම බලකාය වශයෙන් නිර්වචනය කරනු ලැබේ. ජන සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් දියත් කරනු ලැබූ ශ්‍රම බලකා සංගණනයට අනුව 2000 වසරේ තුන්වන කාර්තුව අගදී කුටුම්බ ශ්‍රම බලකාය දශ ලක්ෂ 6.7 වන අතර, ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ශ්‍රම බලකාය, වයස අවුරුදු 10 හා ඊට වැඩි කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස) සියයට 49 ක් විය. 1999 වසරේදී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සියයට 51 ක් වූ අතර 2000 වසරෙහි දෙවන කාර්තුවේදී මෙම අනුපාතිකය සියයට 52 ක් විය. ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය 1990 - 2000 කාලච්ඡේදය තුළ සියයට 48 සිට 52 අතර පරාසයක වෙනස් වූ අතර 1990 දී එම අනුපාතිකය සියයට 52 ක් විය. 1990 වර්ෂයේ සිට 1997 දක්වා එය සියයට 52 සිට සියයට 49 දක්වා අඩු වූ අතර, 1998 වසරේදී එය නැවතත් සියයට 52 දක්වා ඉහළ ගියේය.

**7.3 සංඛ්‍යා සටහන**
**ශ්‍රම බලකා සහභාගිත්වය**

| වර්ෂය | කුටුම්බ ජනගහනය(අ) පුද්ගලයන් '000 | ශ්‍රම බලකාය පුද්ගලයන් '000 | සේවා නියුක්ත පුද්ගලයන් '000 | සේවා වියුක්ත පුද්ගලයන් '000 | ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය % (ආ) |
|---|---|---|---|---|---|
| 1990 | 11,574 | 6,001 | 5,047 | 954 | 51.9 |
| 1991 | 11,796 | 5,877 | 5,016 | 862 | 49.8 |
| 1992 | 12,058 | 5,808 | 4,962 | 846 | 48.2 |
| 1993 | 12,278 | 6,032 | 5,201 | 831 | 49.1 |
| 1994 | 12,493 | 6,079 | 5,281 | 798 | 48.7 |
| 1995 | 12,736 | 6,106 | 5,357 | 749 | 47.9 |
| 1996 | 12,831 | 6,242 | 5,537 | 705 | 48.7 |
| 1997 | 12,871 | 6,266 | 5,608 | 658 | 48.7 |
| 1998 | 12,882 | 6,661 | 6,049 | 611 | 51.7 |
| 1999 | 13,169 | 6,673 | 6,082 | 510 | 50.7 |
| පළමු කාර්තුව | 12,896 | 6,739 | 6,159 | 580 | 52.3 |
| දෙවන කාර්තුව | 13,128 | 6,495 | 5,943 | 552 | 49.5 |
| තෙවන කාර්තුව | 13,202 | 6,705 | 6,092 | 613 | 50.8 |
| සිව්වන කාර්තුව | 13,462 | 6,758 | 6,137 | 621 | 50.2 |
| 2000(ඇ) | 13,538 | 6,867 | 6,343 | 524 | 50.7 |
| පළමු කාර්තුව | 13,498 | 6,854 | 6,308 | 546 | 50.8 |
| දෙවන කාර්තුව | 13,542 | 7,042 | 6,549 | 493 | 52.0 |
| තෙවන කාර්තුව | 13,573 | 6,705 | 6,172 | 532 | 49.4 |

(අ) වයස අවු.10 සහ ඊට වැඩි ජනගහනය
(ආ) ශ්‍රම බලකාය කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස
(ඇ) කාර්තු තුනේ සාමාන්‍යය

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

1998 වසරේ සිට ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය වැඩිවීමේ ප්‍රවණතාවයට අර්ධ වශයෙන් හේතු වූයේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් ගෙවීමක් නොලබන පවුල් ශ්‍රමිකයන්ගේ තවත් කොටස් ශ්‍රම බලකාය තුළට එකතු කිරීම තුළින් තවදුරටත් දත්ත රැස්කිරීමේ පරාසය වැඩිවීමය. ගෙවීම් නොලබන පවුල් ශ්‍රමිකයන් වැඩි වශයෙන් නිරත වූයේ කෘෂිකාර්මික අංශයෙහිය. මේ නිසා, 2000 වසරේ තෙවැනි කාර්තුවේදී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය පහත වැටීම කෙරෙහි සෘතුමය සාධක බලපාන ලදී (එනම් මෙම කාලච්ඡේදය තුළ කෘෂිකාර්මික ක්‍රියාකාරකම් අඩුවීම). ගෙවීම් නොලබන පවුල් ශ්‍රමිකයන්ගේ දායකත්වයෙහි පහත වැටීම 2000 වසරේ දෙවැනි කාර්තුවේ සිට තෙවැනි කාර්තුව දක්වා සියයට 2.9 ක් වූ අතර ඊට සාපේක්ෂව පසුගිය වසරේ එම පහත වැටීම සියයට 1.2 කි.

## 7.4 සේවා නියුක්තිය

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් කරන ලද ශ්‍රම බලකා සමීක්ෂණයේ නිර්වචනයට අනුව "සේවා නියුක්ත පුද්ගලයා" යනු සමීක්ෂණය පවත්වන දිනයට පෙර සතියක් තුළ පැයක් හෝ ඊට වැඩි කාලයක් වේතනයක්, ලාභයක් සඳහා හෝ ගෙවීමක් නොලබා පවුලේ අදායම් ඉපයීමක් සඳහා වැඩකළ පුද්ගලයෙකි. අසනීප වීම, අයහපත් කාලගුණය, කම්කරු ආරාවුල් වැනි සාධක හේතුකොට තාවකාලිකව රැකියාවේ නොයෙදුන අයද සේවා නියුක්ත ලෙස සැලකේ. සේවා නියුක්ත පුද්ගලයන් පුළුල් වශයෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයින්, සේව්‍යයන්, ස්වයං රැකියාලාභීන් සහ ගෙවීම් නොලබන පවුල් ශ්‍රමිකයන් යන කොටස් වලින් සමන්විත වේ.

### 7.4 සංඛ්‍යා සටහන
### සේවා නියුක්ති මූලයන්

(ප්‍රතිශතය)

| වර්ෂය | රාජ්‍ය අංශය | පෞද්ගලික අංශයේ සේවකයින් | සේව්‍යයන් | ස්වයං රැකියාවන්හි නියුතු වූවන් | ගෙවීමක් නොලද පවුලේ සේවකයින් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1990 | 21.5 | 33.7 | 1.8 | 29.2 | 13.8 | 100 |
| 1991 | 22.9 | 39.5 | 2.2 | 25.4 | 10.0 | 100 |
| 1992 | 20.0 | 40.0 | 1.6 | 27.1 | 11.2 | 100 |
| 1993 | 17.4 | 42.8 | 2.0 | 27.4 | 10.4 | 100 |
| 1994 | 16.4 | 44.3 | 2.3 | 27.2 | 9.8 | 100 |
| 1995 | 15.6 | 44.3 | 2.5 | 28.3 | 9.4 | 100 |
| 1996 | 15.0 | 45.8 | 2.3 | 26.8 | 10.0 | 100 |
| 1997 | 15.1 | 44.3 | 2.3 | 28.8 | 9.4 | 100 |
| 1998 | 14.5 | 41.2 | 1.9 | 28.9 | 13.6 | 100 |
| 1999 | 14.4 | 43.1 | 2.0 | 28.3 | 12.2 | 100 |
| පළමු කාර්තුව | 15.0 | 39.7 | 1.6 | 28.8 | 14.9 | 100 |
| දෙවන කාර්තුව | 14.8 | 42.2 | 2.4 | 28.3 | 12.3 | 100 |
| තෙවන කාර්තුව | 13.8 | 45.3 | 2.0 | 27.8 | 11.1 | 100 |
| සිව්වන කාර්තුව | 14.2 | 45.1 | 1.9 | 28.2 | 10.6 | 100 |
| 2000 (අ) | 13.6 | 43.2 | 2.3 | 27.6 | 13.3 | 100 |
| පළමු කාර්තුව | 13.8 | 43.9 | 2.1 | 27.0 | 13.2 | 100 |
| දෙවන කාර්තුව | 13.9 | 41.9 | 2.1 | 27.3 | 14.8 | 100 |
| තෙවන කාර්තුව | 13.0 | 43.9 | 2.7 | 28.6 | 11.9 | 100 |

(අ) කාර්තු තුනේ සාමාන්‍යය

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ශ්‍රම බලකාය තුළ සේවා නියුක්තික ප්‍රතිශතය, 2000 වසරේ ප්‍රථම කාර්තු තුනෙහිදී, පෙර පරිදිම අඛණ්ඩව ඉහළ ගියේය. සමස්ත සේවා නියුක්තිය 1990 දි ශ්‍රම බලකායෙන් සියයට 84 සිට 2000 වසරේ මුල් කාර්තු තුන තුළදී සියයට 92 දක්වා වර්ධනය විය. නිමැවුම් කර්මාන්ත, කෘෂිකර්මය, වාණිජ හා හෝටල්, මූල්‍ය, රක්ෂණ, සහ නිශ්චල දේපල හා ඉදිකිරීම්, රැකියා උත්පාදනය කරන ලද ප්‍රධාන අංශ විය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අනුව

### 7.5 සංඛ්‍යා සටහන
### රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය

| වර්ෂය | රාජ්‍ය ආයතන(අ) | අර්ධ රාජ්‍ය ආයතන(ආ) | එකතුව |
|---|---|---|---|
| 1990 | 649,000 | 703,200 | 1,352,200 |
| 1994 | 699,898 | 625,266 | 1,325,164 |
| 1995 | 737,504 | 569,484 | 1,306,988 |
| 1996 | 752,194 | 409,278 | 1,161,472 |
| 1997 | 762,067 | 309,633 | 1,071,700 |
| 1998 | 790,492 | 300,654 | 1,091,146 |
| 1999(ඇ) | 822,122 | 298,248 | 1,120,370 |
| 2000(ඇ) | 856,665 | 299,615 | 1,156,280 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මධ්‍යම රජය, පළාත් සභා සහ ප්‍රාදේශීය සභා
(ආ) රාජ්‍ය සංස්ථා, මණ්ඩල, අධිකාරීන්
(ඇ) තාවකාලික දත්ත

2000 වසර තුළදී ආයෝජන මණ්ඩලය මගින් අනුමත කරන ලද ව්‍යාපෘතීන්හී රැකියා අවස්ථා 41,000 ක් පමණ ජනනය විය. රෙදිපිළි, ඇහලුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදන සහ සේවා සහ උද්‍යාන විද්‍යා අංශයන් මගින් නව රැකියා අවස්ථා 30,000 ක් පමණ ජනනය කරනු ලැබූ අතර එය ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන් තුළින් ජනනය කළ මුළු රැකියා අවස්ථාවන් ගෙන් සියයට 73 ක් විය.

සමස්ත සේවා නියුක්තියෙහි රාජ්‍ය අංශයේ සේවා නියුක්ති දායකත්වය පහත වැටීමේ ප්‍රවණතාවය 2000 දී ද දක්නට ලැබිණි. එහි දායකත්වය 1990 දී වූ සියයට 21.5 සිට 2000 වසරේ මුල් කාර්තු තුන තුළදී සියයට 13.6 දක්වා අඩු විය. පෞද්ගලික අංශය, එහි ආර්ථික ක්‍රියාකාරකම්වල වේගවත් ප්‍රසාරණය හේතුකොටගෙන, රැකියා උත්පාදන දායකත්වයෙහි ප්‍රධාන සාධකය ලෙස තවදුරටත් පැවතුණි. සමස්ත සේවා නියුක්තියෙහි රාජ්‍ය අංශයේ (රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය) දායකත්වය පහත වැටීම, අර්ධ රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම සහ සිදු වෙමින් පවතින පෞද්ගලිකකරණය කිරීමේ ක්‍රියාදාමය තුළින්ද පිළිබිඹු වෙයි. කෙසේ වුවද, ශ්‍රී ලංකා මහ බැංකුව මගින්, මධ්‍යම රජය, ප්‍රාදේශීය සභා සහ පළාත් සභා සහ රාජ්‍ය සංස්ථා, මණ්ඩල සහ අධිකාරී වැනි අර්ධ රාජ්‍ය ආයතන ආවරණය වන පරිදි රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ කරන ලද සමීක්ෂණයට අනුව, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය සියයට 3.2 කින් පමණ වර්ධනය වෙමින් 2000 වසර තුළදී 1,160,000 ක් විය. රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 36,000 කින් පමණ වැඩිවූ අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක වූයේ 34,500 ක වැඩිවීමක් පෙන්නුම් කළ රාජ්‍ය ආයතනයන්

හි සේවා නියුක්ති යයි. සැලකිය යුතු වර්ධනයක් සටහන් වූයේ, ආරක්ෂක අංශ, ගුරුවරුන් සහ සමෘද්ධි නියාමක යන අංශවල සේවා නියුක්තියෙහිය. අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තිය සියයට 1 කින් පමණ වර්ධනය වෙමින් 2000 වසර තුළදී 300,000 ක් විය.

## 7.5 සේවා වියුක්තිය

2000 වසරේ ප්‍රථම කාර්තු තුන තුළදී සේවා වියුක්ති අනුපාතිකය 1999 පැවති මට්ටමට සාපේක්ෂව පහත තලයක වූ අතර, පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයෙහි සේවා නියුක්තියෙහි වර්ධනය මේ සඳහා හේතු විය. 1990 පැවති සියයට 15.9 සිට 1999 තුළදී සියයට 8.9 දක්වා පහත වැටුණු සේවා වියුක්ති අනුපාතය, 2000 වසරේ ප්‍රථම කාර්තු තුන තුළදී සියයට 7.7 ක් විය. සේවා වියුක්ති අනුපාතිකය පිළිබඳ ඇස්තමේන්තු 1998 සිට පහතට නැඹුරුවීමේ ලා බලපෑ හේතුවක් ලෙස ගෙවීම් නොලබන ඇතැම් පවුල් ශ්‍රමිකයන් ශ්‍රම බලකාය තුළට අලුතින් අවශෝෂණය කරගැනීම සඳහන් කළහැක. කෙසේ වුවද සේවා වියුක්ති අනුපාතිකයේ පහත වැටීමේ ප්‍රවණතාව, ගෙවීම් නොලබන

**7.6 සංඛ්‍යා සටහන**
**සේවා වියුක්ති අනුපාතිකය**
**(ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස)**

| වර්ෂය | සතියක විමර්ශන කාලය | | | | මාස 12 විමර්ශන කාලය |
|---|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | සමස්ත | ගෙවීමක් නොලද පවුලේ සේවකයින් හැර සමස්ත (අ) | සමස්ත |
| 1990 | 11.8 | 23.4 | 15.9 | 18.0 | 17.4 |
| 1991 | 10.2 | 23.0 | 14.7 | 16.0 | 16.1 |
| 1992 | 10.7 | 22.9 | 14.6 | 16.1 | 16.2 |
| 1993 | 9.7 | 21.7 | 13.8 | 15.1 | 17.5 |
| 1994 | 9.7 | 20.1 | 13.1 | 14.3 | 12.9 |
| 1995 | 8.8 | 18.8 | 12.3 | 13.4 | 12.0 |
| 1996 | 8.5 | 18.0 | 11.3 | 12.4 | 11.8 |
| 1997 | 7.7 | 16.1 | 10.5 | 11.5 | 11.6 |
| 1998 | 6.5 | 14.0 | 9.2 | 10.5 | 10.4 |
| 1999 | 6.7 | 13.0 | 8.9 | 10.0 | 9.1 |
| පළමු කාර්තුව | 6.8 | 11.8 | 8.6 | 10.0 | 8.2 |
| දෙවන කාර්තුව | 6.3 | 13.0 | 8.5 | 9.6 | 9.0 |
| තෙවන කාර්තුව | 7.4 | 12.6 | 9.1 | 10.2 | 10.2 |
| සිව්වන කාර්තුව | 6.3 | 14.7 | 9.2 | 10.2 | 9.9 |
| 2000(ආ) | 5.9 | 11.0 | 7.7 | 8.7 | 8.4 |
| පළමු කාර්තුව | 6.4 | 11.1 | 8.0 | 9.1 | 8.8 |
| දෙවන කාර්තුව | 5.3 | 10.1 | 7.0 | 8.1 | 7.8 |
| තෙවන කාර්තුව | 6.0 | 11.8 | 8.0 | 8.9 | 8.6 |

(අ) ගෙවීමක් නොලද පවුලේ සේවකයන් ශ්‍රම බලකායෙන් ඉවත් කොට ඇස්තමේන්තු කළ සේවා වියුක්ති අනුපාතිකය
(ආ) කාර්තු තුනේ සාමාන්‍යයි

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

පවුල් ශ්‍රමිකයන් බැහැර කොට ගලපා බලනවිට ද පැහැදිලිව දක්නට ඇත. ගෙවීම් නොලබන පවුල් ශ්‍රමිකයන් බැහැර කොට ගලපන ලද සේවා වියුක්ති අනුපාතිකය 1999 දී වූ සියයට 10 ට සාපේක්ෂව 2000 වසරේදී සියයට 8.7 ක් යයි ඇස්තමේන්තු කොට ඇති අතර මෙය, ගැලපීමට පෙර සේවා වියුක්ති අනුපාතිකයේ 1999 සිට 2000 වර්ෂය දක්වා සියයට එකක පමණ අඩුවීමට සමාන වූ පහත වැටීමක් පිළිබිඹු කරයි. තවද, ශ්‍රම බලකා සමීක්ෂණයේදී අවුරුද්දක අදළ කාලච්ඡේදය තුළදී පුද්ගලයන්ගේ ශ්‍රම සැපයීම පදනම් කොටගෙන සේවා නියුක්තිකයන් හා සේවා වියුක්තිකයන් හඳුන්වා දෙන ලදී. මෙම නිර්වචනයට අනුව සේවා වියුක්ත ලෙස ගැනෙන්නේ සමීක්ෂණයට පෙර මාස 12 තුළ සති 26 ක් හෝ ඊට වැඩි කාලයක් තුළ රැකියාවක් නොතිබූ පුද්ගලයන්ය. මෙම නිර්වචනයට අදළ සේවා වියුක්ති අනුපාතිකයද 1990 දී සියයට 17.4 සිට 2000 වසරේ මුල් කාර්තු තුන තුළදී සියයට 8.4 දක්වා පහත වැටුණි.

ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය, පුරුෂ සේවා වියුක්ති අනුපාතිකයට සාපේක්ෂව සීඝ්‍රයෙන් පහත වැටීම මෙම වසරේ දී ද දක්නට ලැබිණි. ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය 1990 දී වූ සියයට 23.4 සිට 1999 දී සියයට 13 දක්වා ද 2000 වසරේ මුල් කාර්තු තුන තුළදී සියයට 11.0 දක්වාද පහත වැටුණු අතර පුරුෂ සේවා වියුක්ති අනුපාතිකය 1990 දී වූ සියයට 11.8 සිට 1999 දී සියයට 5.7 දක්වා සහ 2000 වසරේ මුල් කාර්තු තුන තුළදී සියයට 5.9 දක්වාද පහත වැටුණි. මෑත වසරවලදී නිමැවුම්, කෘෂිකාර්මික හා වාණිජ සහ හෝටල් යන අංශයන්හි ස්ත්‍රීන් සඳහා රැකියා අවස්ථා වර්ධනය වීම ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකයෙහි තියුණු පහත වැටීමට හේතු විය.

වයස කාණ්ඩ අනුව වූ සේවා වියුක්තිය පිළිබඳව සලකා බලන විට අවුරුදු 15-19 කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතය 1999 සිට සැලකිය යුතු පහත වැටීමක් පෙන්වයි. මෙම වයස් කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතිකය 1990 දී වූ සියයට 40 ට සාපේක්ෂව 2000 වසරේ මුල් කාර්තු තුන ඇතුළත සියයට 22 ක් විය. තවද, 1990 සිට 2000 දක්වා කාලච්ඡේදය තුළ වයස අවුරුදු 20-29 කාණ්ඩයෙහි සේවා වියුක්ති අනුපාතිකය සියයට 30 සිට සියයට 18 දක්වා පහත වැටීමට සාපේක්ෂව 15-19 වයස් කාණ්ඩයෙහි සේවා වියුක්තියෙහි තියුණු පහත වැටීමක් පෙන්නුම් කරයි. සේවා වියුක්තිය වඩාත් ඉහළ ප්‍රමාණයක පවතින්නේ වයස අවුරුදු 20-29 අතර කාණ්ඩයට අයත්වන අ.පො.ස. (උ.පෙ.) සහ ඊට ඉහළ සුදුසුකම් ඇති පුද්ගලයන් අතරය. අ.පො.ස. (උ.පෙ.) හා ඉන් ඉහළ අධ්‍යාපනය ලද පුද්ගලයන් අතර සේවා වියුක්තිය 2000 වසරේ මුල් කාර්තු තුන තුළදී සියයට 14.6 ක් විය. අඩු අධ්‍යාපන සුදුසුකම් ලද්දවුන් අතර සේවා වියුක්ති අනුපාතිකය පහළ මට්ටමක පැවතිණි. උසස් අධ්‍යාපනය ලත් පුද්ගලයන් අතර සේවා වියුක්ති අනුපාතිකය ඉහළ තලයක පැවතීම කෙරෙහි අර්ධ වශයෙන් හේතුවූයේ පෞද්ගලික අංශයේ ශ්‍රම වෙළෙඳපොළට අවශ්‍ය වන්නා වූ ඉංග්‍රීසි දැනුම සමග පරිගණක විද්‍යාව, මූල්‍ය, කළමනාකරණ හා අලෙවිකරණය යන අංශයන්හි සුදුසුකම් සහිත පුද්ගලයන් සැපයීමට සාම්ප්‍රදායික විෂයයන් උගන්වන්නා වූ පැරණි අධ්‍යාපනය ක්‍රම තුළින් අසීරුවීමය. විශේෂයෙන් පෞද්ගලික අංශය තුළින් මෙහි ඇතිවන මිනිස් බල ඉල්ලුමෙහි වෙනස්වීමට

7.7 සංඛ්‍යා සටහන
වයස් කාණ්ඩ අනුව සේවා වියුක්ති අනුපාතිකය
(ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස)

| වර්ෂය | වයස් කාණ්ඩ | | | | | සමස්ත |
|---|---|---|---|---|---|---|
| | 15 - 19 | 20 - 29 | 30 - 39 | 40 - 49 | 50 සහ ඉහළ | |
| 1990 | 40.1 | 30.3 | 8.4 | 4.0 | 2.1 | 15.9 |
| 1991 | 37.6 | 27.5 | 9.1 | 3.6 | 1.0 | 14.7 |
| 1992 | 39.1 | 27.5 | 7.8 | 3.5 | 1.4 | 14.6 |
| 1993 | 38.4 | 25.2 | 8.4 | 3.3 | 1.5 | 13.8 |
| 1994 | 40.7 | 24.5 | 7.6 | 2.5 | 1.2 | 13.1 |
| 1995 | 60.5 | 31.7 | 8.0 | 2.9 | 0.4 | 12.3 |
| 1996 | 36.5 | 22.0 | 6.0 | 1.9 | 0.5 | 11.3 |
| 1997 | 34.0 | 21.9 | 5.2 | 1.7 | 0.6 | 10.5 |
| 1998 | 27.3 | 19.3 | 4.9 | 2.0 | 0.7 | 9.2 |
| 1999 | 28.4 | 18.9 | 4.4 | 1.6 | 1.0 | 8.9 |
| පළමු කාර්තුව | 25.5 | 20.2 | 4.0 | 1.1 | 0.8 | 8.6 |
| දෙවන කාර්තුව | 29.5 | 17.3 | 4.2 | 1.7 | 1.4 | 8.5 |
| තෙවන කාර්තුව | 32.0 | 18.9 | 5.3 | 1.3 | 0.8 | 9.1 |
| සිව්වන කාර්තුව | 27.2 | 19.3 | 4.2 | 2.2 | 1.0 | 9.2 |
| 2000(අ) | 22.0 | 17.9 | 3.6 | 1.3 | 0.9 | 7.7 |
| පළමු කාර්තුව | 22.1 | 19.0 | 3.8 | 1.1 | 0.7 | 8.0 |
| දෙවන කාර්තුව | 22.5 | 15.0 | 3.6 | 1.6 | 0.9 | 7.0 |
| තෙවන කාර්තුව | 21.3 | 19.7 | 3.3 | 1.2 | 1.0 | 8.0 |

(අ) කාර්තු තුනේ සාමාන්‍ය

මූලය : ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

සරිලන පරිදි පාසල් හා උසස් අධ්‍යාපනික පද්ධති ප්‍රතිව්‍යුහගත කළයුතු වන අතර එය මෑතදී හඳුන්වා දෙන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් ඉටු වේ යැයි අපේක්ෂා කරන අතර එමගින් උගතුන් අතර අධිකව පවතින්නාවූ සේවා වියුක්තිය පහත වැටෙනු ඇතැයි බලාපොරොත්තු වේ.

## 7.6 විදේශ සේවා නියුක්තිය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති (ශ්‍රී.ලං.වි.සේ.නි.) කාර්යාංශයෙහි ලියාපදිංචි විදේශ රැකියා අවස්ථාවන්, 1999 දී වූ 178,000 සිට 2000 වසරේදී 166,000 දක්වා 12000 කින්

7.8 සංඛ්‍යා සටහන
අධ්‍යාපන මට්ටම අනුව සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස)

| වර්ෂය | පාසැල් අධ්‍යාපනයක් නොමැති | 0-4 ශ්‍රේණිය 1-5 වසර | 5-9 ශ්‍රේණිය 6-10 වසර | අ.පො.ස.(සා.පෙ.) ජා.පො.අ.ස. | අ.පො.ස.(උ.පෙ.) උ.ජා.අ.ස. සහ ඉහළ | සමස්ත |
|---|---|---|---|---|---|---|
| 1990 | 3.3 | 5.1 | 17.2 | 23.9 | 29.4 | 15.9 |
| 1991 | 3.9 | 4.9 | 14.9 | 25.0 | 24.6 | 14.7 |
| 1992 | 3.0 | 4.7 | 15.9 | 22.2 | 22.4 | 14.6 |
| 1993 | 3.1 | 4.9 | 13.7 | 21.3 | 23.3 | 13.8 |
| 1994 | 2.6 | 5.0 | 13.0 | 19.6 | 23.7 | 13.1 |
| 1995 | 1.8 | 3.4 | 12.8 | 18.4 | 20.0 | 12.3 |
| 1996 | 2.8 | 3.4 | 12.2 | 16.4 | 19.0 | 11.3 |
| 1997 | 2.0 | 2.4 | 10.6 | 15.9 | 19.3 | 10.5 |
| 1998 | 1.0 | 2.4 | 9.0 | 13.7 | 17.5 | 9.2 |
| 1999 | 0.4 | 1.9 | 8.2 | 13.6 | 17.9 | 8.9 |
| පළමු කාර්තුව | 0.1 | 1.7 | 8.0 | 12.4 | 19.6 | 8.6 |
| දෙවන කාර්තුව | 1.1 | 1.7 | 8.2 | 12.5 | 15.8 | 8.5 |
| තෙවන කාර්තුව | 0.3 | 2.2 | 9.1 | 13.8 | 16.9 | 9.1 |
| හතරවන කාර්තුව | 0.1 | 2.1 | 7.3 | 15.6 | 19.3 | 9.2 |
| 2000 (අ) | 1.4 | 1.1 | 7.4 | 11.5 | 14.6 | 7.7 |
| පළමු කාර්තුව | 1.3 | 1.1 | 7.9 | 11.2 | 15.4 | 8.0 |
| දෙවන කාර්තුව | 1.8 | 1.1 | 6.8 | 11.4 | 13.1 | 7.0 |
| තෙවන කාර්තුව | 1.2 | 1.0 | 7.6 | 12.0 | 15.2 | 8.0 |

(අ) කාර්තු තුනේ සාමාන්‍යය

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පමණ පහත වැටුණි. මෙය, 1999 දී වූ 18,000ක වර්ධනයට ප්‍රතිවිරුද්ධ තත්වයකි. ශ්‍රී ලං.වි.සේ.නි. කාර්යාංශයට අනුව, විදේශ රැකියා ප්‍රමාණය පහත වැටීම කෙරෙහි, 2000 වසර තුළදී රාමසාන් උත්සව 2 ක් පැවතීම විශේෂයෙන් බලපෑවේය. රාමසාන් කාලච්ඡේදයේදී මැද පෙරදිග රටවල සමස්ත කටයුතුවල ක්‍රියාකාරිත්වය පහත මට්ටමක පැවතීම විදේශික ශ්‍රමිකයන් කෙරෙහි වූ ඉල්ලුම පහත වැටීම කෙරෙහි බලපෑවේය. බලයලත් රැකියා ඒජන්තවරුන් මගින් ලැබූ සේවා නියුක්ති දයකත්වය, 1999 දී වූ 120,000 සිට 2000 වසර තුළදී 127,000 දක්වා ඉහළගිය අතර මෙය ප්‍රතිශතක දයකත්වයක් වශයෙන් ගත් කල 1999 දී වූ සියයට 68 සිට 2000 වසරේදී සියයට 76 දක්වා වූ වර්ධනයක් පෙන්වයි. මෙම වර්ධනය කෙරෙහි ශ්‍රී ලං.වි.සේ.නි. කාර්යාංශය විසින් බලයලත් රැකියා ඒජන්තවරුන් විධිමත් කිරීම හා අධීක්ෂණය කිරීම හේතු කොටගෙන විදේශ රැකියා ඒජන්තවරුන් කෙරෙහි විදේශ ශ්‍රමිකයන් තුළ විශ්වාසය ගොඩනැගීම බලපාන ලදී. විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුව 1999 වර්ෂය තුළදී ක්‍රියාකාරී පිළිගත් පෞද්ගලික පුහුණු නියෝජිතයන් සංඛ්‍යාව 29 ක් විය. කෙසේ වුවද මෙම පෞද්ගලික පුහුණු නියෝජිත ආයතනයන් මගින් ලබා දෙන පුහුණු වැඩමුළුවල ඇති වූ අක්‍රමිකතා හේතුවෙන්, ශ්‍රී.ලං.වි.සේ.නි. කාර්යාංශය 2000 වසරේදි විදේශ ශ්‍රමිකයන් පුහුණු කිරීමේ වැඩමුළු තමන් විසින්ම පමණක් පවත්වාගෙනයාමේ ප්‍රතිපත්තිමය තීරණයකට එළඹිණි. එසේ වුවද පුහුණු වැඩමුළු සඳහා ඇති ඉල්ලුම සම්පූර්ණයෙන් තනිවම සපුරා ලීමට නොහැකි වූ හෙයින් ශ්‍රී.ලං.වි.සේ.නි. කාර්යාංශය විසින් 2000 වසරේදී පෞද්ගලික පුහුණු නියෝජිතයින් 8 දෙනෙකුගේ ද සේවය ලබා ගන්නා ලදී.

ශ්‍රී.ලං.වි.සේ.නි. කාර්යාංශය මගින් ලියාපදිංචි විදේශ ශ්‍රමිකයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට තවදුරටත් පහසුකම් ගණනාවක් සපයනු ලැබිණි. මහජන බැංකුව හරහා සපයනු ලබන නිවාස හා ස්වයං රැකියා ණය, පුහුණු පහසුකම් සඳහා අවස්ථා සහ විදේශ ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා රක්ෂණ ක්‍රම ආදිය මීට ඇතුළත් වෙයි.

1997 සිට සමහර රටවල කාන්තා විදේශ ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සහ ඔවුන්ට වඩාත් හොඳ සේවා තත්වයන් සැපයීම පිළිබඳව සේව්‍යයා හා සේවකයා අතර සේවා ගිවිසුම් ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලැබේ. 2000 වසර අවසානයේදී රටවල් 12 ක, එම රටවල තානාපති කාර්යාලවල ද සහයෝගය ඇතිව ශ්‍රී.ල.වි.සේ.නි. කාර්යාංශය විසින් මෙම ක්‍රමය සම්බන්ධීකරණය කෙරෙමින් පැවතිනි. පෙර පරිදි 2000 වසරෙහි දී ද 1990 ගල්ෆ් යුද්ධය හේතුවෙන් කුවේට් රටෙහිදී අවතැන් වූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට වන්දිගෙවීම ශ්‍රී.ලං.වි.සේ.නි. කාර්යාංශයෙහි මැදිහත්වීමෙන් සිදු කෙරිණි.

**7.9 සංඛ්‍යා සටහන**
**විදේශ සේවා නියුක්තිය**

| ශීර්ෂය | 1995 | 1996 | 1997 | 1998 | 1999 | 2000(අ) |
|---|---|---|---|---|---|---|
| විදේශ රැකියා සංඛ්‍යාව | 172,489 | 162,576 | 150,283 | 159,816 | 178,052 | 166,489 |
| මූලයන් අනුව | | | | | | |
| ලියාපදිංචි නියෝජිතයින් | 118,692 | 115,446 | 115,043 | 112,539 | 120,218 | 127,115 |
| වෙනත් | 53,797 | 47,130 | 35,240 | 47,277 | 57,834 | 39,374 |
| ස්ත්‍රී/පුරුෂ අනුව | | | | | | |
| පුරුෂ | 46,021 | 42,112 | 37,552 | 53,867 | 62,949 | 51,850 |
| ස්ත්‍රී | 126,468 | 120,464 | 112,731 | 105,949 | 115,103 | 114,639 |
| ශ්‍රම කාණ්ඩ අනුව | | | | | | |
| ගෘහ සේවිකා | 113,860 | 110,479 | 99,429 | 85,349 | 87,191 | 92,327 |
| පුහුණු ශ්‍රමිකයන් | 27,165 | 24,447 | 24,578 | 31,787 | 37,145 | 33,115 |
| නුපුහුණු ශ්‍රමිකයන් | 23,497 | 21,735 | 20,485 | 34,109 | 43,153 | 31,588 |
| වෙනත් | 7,967 | 5,915 | 5,791 | 8,571 | 10,563 | 9,459 |
| ලියාපදිංචි රැකියා නියෝජිත ආයතන (වර්ෂය අවසානයේ) | 477 | 464 | 520 | 385 | 431 | 445 |
| පුහුණුකිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව | | | | | | |
| විදේශ රැකියා කාර්යාංශය | 12 | 15 | 15 | 17 | 20 | 20 |
| වෙනත් නියෝජිතයන් | - | 22 | 22 | 28 | 29 | 8 |

(අ) තාවකාලික දත්ත

මූලය : ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය